**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - 2013**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.312,100 ක් පුනරාවර්තන වියදම් සඳහා වැයකිරීම නිසා වැය නොකළ රජයේ ප්‍රාග්ධන ගිණුම හා රජයේ ප්‍රාග්ධන මුදල් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විද්‍යාගාර උපකරණ මිලදී ගැනීමේදී රඳවා ගැනීම් රු.586,100 ක් දෙවරක් සටහන් කිරීම නිසා විද්‍යාගාර උපකරණ ගිණුම හා රැඳවුම් ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී ස්ථාවර වත්කම් වර්ග 05ක් රු.318,070,239 කට ප්‍රත්‍යාගණනය කර තිබූ නමුත් එම වත්කම්වල ඵලදායි ජීවිතකාලය හඳුනාගෙන නොතිබීම හේතුවෙන් නිවැරදි පරිදි ක්ෂය ගණනය කිරීම් සිදුකර නොතිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් මාසයේදී පැවැත්වූ යුනානි හා ආයුර්වේද ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ වියදම් පියවා ගැනීම සඳහා අනුග්‍රහ හවතුන්ගෙන් රු.2,737,736 ක ලැබීම් සහ දරන ලද රු.2,540,826 ක වියදම්, ආදායම් හා වියදම් ගිණුමන් නිරූපණය නොකර තවදුරටත් ඉතිරි වූ රු.196,910 ක ශේෂය සඳහා ගෙවිය යුතු වියදම් හඳුනා නොගෙන ජංගම වගකීම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය රු. 179,051 ක් වුවද අවලංගු කළ චෙක්පත් ලේඛනය අනුව එම ශේෂය රු. 1,664,810 ක් බව නිරීක්ෂණය විය. මෙම වෙනස හඳුනාගෙන ගිණුම නිරවුල් කර නොතිබූ අතර රු. 31,797 ක් පමණක් වර්ෂය තුළ දී හඳුනාගැනීමකින් තොරව පොදු සංචිත ගිණුමට මාරු කර තිබුණි.

(ඊ) 2012 දෙසැම්බර් 14 දින පැවති අබලි භාණ්ඩ වෙන්දේසියේදී වත්කම් වර්ග 67 කට අයත් වත්කම් ඒකක 197 ක් රු.49,665කට අලෙවි කර තිබූ අතර එම වත්කම්වල පිරිවැය හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමට කටයුතු නොකර මුළු වත්කම්වල පිරිවැය මත සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 ලැබියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය අනුග්‍රහය මත පශ්චාත් උපාධි පුහුණුවක් සඳහා විදේශ ගතවූ කථිකාචාර්යවරයෙකුගේ ගුවන් ටිකට්පත් ගාස්තු ලෙස 2012 වර්ෂයේදී ආයතනයෙන් ගෙවූ රු.79,000 ක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 188(2) | ජංගම ගිණුම් දෙකක මාස කිහිපයක් තිස්සේ උපලබ්ධි නොවී පවතින රු.12,027 ක් වූ තැන්පතු 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 757(2) | 2012 හා 2013 වර්ෂයන්හි භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල දැක්වෙන භාණ්ඩ ඒකක 60 ක ඌණතාවයන් හා භාණ්ඩ ඒකක 84 ක අතිරික්තයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2002 ඔක්තෝබර් 16 දිනැති අංක 09/2002 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | සාමාන්‍ය රාජකාරි කටයුතු සඳහා නිසි අධිකාරී බලයකින් තොරව 89 දෙනෙකු වූ මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් 81 දෙනෙකු සඳහාම අතිකාල දීමනා ලෙස රු.1,256,570 ක් ගෙවා තිබූ අතර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමත ප්‍රතිපාදනයෙන් සියයට 25 ක් රඳවාගත යුතු නමුත් සියයට 99 ක් වැයකර තිබුණි. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සාමාන්‍ය රාජකාරි වේලාවන් තුළදී ඉටුකල රාජකාරි සඳහා සමාලෝචිත වර්ෂය තුළදී දීමනා ලෙස රු.1,089,877 ක් ගෙවා තිබුණි. |
| (ඈ) | 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය | එකතු කළ අගය මත බදු ගෙවීම් සම්බන්ධයෙන් මාසික වාර්තා විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවිය යුතු වුවත් රු.3,054,587 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | නියමිත කාලරාමුව තුළ වත්කම් සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 2009 ඔක්තෝබර් 11 දිනැති අංක ඩීඑම්ඒ/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

(ආ) කොන්ත්‍රාත්කරුවන්ට රඳවාගත් මුදල් ආපසු ගෙවීමේදී රැඳවුම් මුදල් ගිණුමට හර කරනු වෙනුවට වෙනත් ගිණුම්වලට හර කරඇති බවට සමාලෝචිත වර්ෂයේ ගෙවීම් වලින් ද තහවුරු වී ඇති බැවින් රැඳවුම් මුදල් ලෙජර් ගිණුමෙහි ශේෂ වී ඇති කොන්ත්‍රාත් 03 ක් අතුරින් කොන්ත්‍රාත්කරුවෙකුගෙන් 2006 වර්ෂයේ දී රඳවාගෙන තිබූ රු.1,593,064 ක මුදල නොගෙවූ එකක් නොවන බවට විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | රැඳවුම් මුදල් | 5,837,623 | විධිමත් හා සම්පූර්ණ කළ ලේඛනය සහ කාල විශ්ලේෂණය |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය නොවන ගැලපීම් | 159,219 | විස්තරාත්මක ලේඛනය |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය, රු.98,204 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,270,709 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,172,505 කින් වර්ධනය වීම කෙරෙහි රජයේ ප්‍රදාන රු.34,803,825 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කටයුතුවල යෙදුනු 876 ක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා වැයකල පුනරාවර්තන වියදම රු.223,548,286 ක් වුයෙන් ඒකක ශිෂ්‍ය පිරිවැය රු.255,192 ක් විය.

(ආ) ආයතනයේ පාඨමාලා සඳහා ලියාපදිංචි ශිෂ්‍යයන් 1061 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය වන විට ශිෂ්‍යයන් 185 දෙනෙකු පාඨමාලා හැරගොස් තිබූ අතර එය ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 17 ක් විය.

(ඇ) විභාග සඳහා පෙනීසිටින ශිෂ්‍යයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් විභාග අසමත්වන බව නිරීක්ෂණය වූ අතර 2011 ජුනි සිට 2013 නොවැම්බර් දක්වා පැවැත්වූ වාර්ෂික විභාග සඳහා පෙනීසිටි ශිෂ්‍යයන් 1632 දෙනෙකු අතුරින් ශිෂ්‍යයින් 692 දෙනෙකු හෙවත් සියයට 42 ක් විභාග වලින් අසමත් වී තිබුණි.

(ඈ) වසර කිහිපයක් අඛණ්ඩව පවත්වන ලද භෛසජ්ජ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා රු.26,880 ක් වැයකර පුවත්පත් දැන්වීමක් පළකර තිබුණද ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම මත 2013 වර්ෂයේදී එම පාඨමාලාව පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ඉ) ආයුර්වේද හා යුනානි උපාධි පාඨමාලා සඳහා අනුයුක්ත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශකවරුන් 12 දෙනෙකු 2013 මැයි, ජුනි හා ජුලි මාස වල පමණක් ආයුර්වේද වෛද්‍ය විශාරද පාඨමාලාව සඳහා සාමාන්‍ය රාජකාරි වේලාව තුළ දේශන සහ ප්‍රායෝගික පැය 135 ක් පවත්වා ගාස්තු ලෙස රු.132,500 ක් ලබාගෙන තිබුණි.

(ඊ) ආයුර්වේද වෛද්‍ය විශාරද පාඨමාලා විෂය නිර්දේශය අනුව මාස 06 ක විදේශ පුහුණුවක් ලැබිය යුතු වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව මාස 03 ක පුහුණුවක් පමණක් ලබාදී තිබුණි.

(උ) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා රජයෙන් දරනු ලබන පොදු කාර්යය වියදම් රු.291,470 ක් පාඨමාලා ආදායමෙන් පියවා නොගෙන ආයතනයේ අරමුදල් වලින් දරා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පූර්ව අනුමත ඇස්තමේන්තුවකින් සහ රාජකාරි නිවාඩු අනුමත කිරීමකින් තොරව කථිකාචාර්යවරුන් දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ශිෂ්‍යයන් සමඟ සහභාගිවූවායැයි දක්වා රු.660,825 ක් වියදම් කර තිබුණු අතර ඒ තුළ රු.81,000 ක වාහන කුලියක්ද රු.35,000ක මුද්‍රිත වියදම් ද ප්‍රදර්ශනයෙන් පසු දිනෙක රු.52,265 ක වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේ බිල්පතක්ද ඇතුළත් වී තිබුණි.

(ආ) 2012 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් වූ නුසුදුසු පොත් 3810 ක්, බැහැරදී නැවත භාර නොදුන් පොත් 188 ක් හා භෞතික වශයෙන් නොපැවති පොත් 4882 ක් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, ඒ සඳහා ගිණුම්වල ගැලපීම්ද සිදුකර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා වැඩිපුර සිසුන් 25 ක් පමණක් ආයතනයට යොමුකර ඇති බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ සඳහන්ව තිබියදී රු.2,079,000 ක් ගෙවා ශිෂ්‍ය අත්පුටු 375 ක් අලුතෙන් මිලදී ගෙන තිබුණි.

(ආ) පශ්චාත් උපාධි ජංගම ගිණුමෙහි මුදල් නිශ්කාර්යව පැවතියදී එම අංශයේ පරිහරණය සඳහා දේශනශාලා පුටු 60 ක් මිලදී ගැනීම සඳහා රජයේ ආධාර රු.453,600 ක් වැය කර තිබුණි.

(ඇ) ක්‍රීඩාපිටිය වැඩිදියුණු කිරීම සඳහා වූ රු.6,000,000 ක ප්‍රතිපාදිතයෙන් මැනුම්පත් හා ඇස්තමේන්තුවලින් තොරව වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කර අවස්ථා 05 කදී පස් මිලදී ගැනීම සඳහා රු.2,372,132 ක් වැයකර තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

දර්ශන විශාරද උපාධිය හැදෑරීම සඳහා ආයතනයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයෙකු වෙත මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙන් 2006 සහ 2008 වර්ෂවලදී පිළිවෙලින් රු.297,000 ක් හා රු.293,000 ක් වශයෙන් රු.590,000 ක ප්‍රදානයක් ලබාදී තිබුණද අධ්‍යයන නිවාඩු ලබාගැනීමකින් තොරව 2011 වර්ෂයේදී විදේශ රටක වර්ෂයක කාලයක් රැකියාවක් කර ඇති අතරම ඔහු නියමිත ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබු බැවින් දර්ශන විශාරද උපාධිය හැදෑරු බවට සනාථ විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

පශ්චාත් උපාධි මුදල් පොත අනුව 2013 වර්ෂයේ සාමාන්‍ය මාසික ගෙවීම් රු.326,928 ක් වුවද, රු.1,662,690 ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් පවත්වා ගෙන තිබු අතර 2013 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.2,727,387 ක් විය. 2005 ජුලි 13 දිනැති අංක 30 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතන තාවකාලික භාරකාර අරමුදලේ අතිරික්ත මුදල් ආයෝජනය කර අතිරේක ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.6 ආර්ථික නොවු ගනුදෙනු**

වායුසමීකරණ යන්ත්‍ර දෙකක් අලුත්වැඩියා කරගැනීම සඳහා මිලගණන් ලබාගෙන පුද්ගලික ආයතනයක් වෙත භාරදීමෙන් අනතුරුව එම යන්ත්‍ර අලුත්වැඩියා කිරීම ආර්ථික නොවන බවට ගනු ලැබු තිරණයක් මත අලුත්වැඩියා නොකර ආපසු ලබාගෙන තිබුණද, එහෙත් යන්ත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු ලෙස රු.11,650 ක් වැයකර තිබුණි.

**4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

2013/2014 අධ්‍යයන වර්ෂයේ සිසුන්ට දේශන පැවැත්වීම සඳහා අර්ධ ස්ථිර (Semi Permanent) ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සඳහා ගොඩනැගිලි සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව ආයතන දෙකකින් මිලගණන් ලබාගෙන තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ සැලසුම් හා ඇස්තමේන්තුමත රු.4,743,282 ක වියදමක් දරා තිබුණි.

**4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව 2013 අගෝස්තු 01 දින කම්කරු සේවයට බඳවාගත් සේවකයකු බඳවාගත් දින සිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. එදින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වැටුප්, සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් වශයෙන් රු.101,203 ක් ආයතනයෙන් ගෙවා තිබුණි.

**4.9 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 40 ක් පුරප්පාඩු වී තිබුණි.

**4.10** වාහන උපයෝජනය

වසර 04 කට පෙර මිලදී ගන්නා ලද මෝටර් රථයක් කි.මී.50,300 ක් දුර දිවීමෙන් අනතුරුව මිල ගණන් කැඳවීමකින් තොරව රු.315,971 ක වියදමකින් තීන්ත ආලේප කර තිබූ අතර අභ්‍යන්තර අළුත්වැඩියාවකදී දින දෙකක් පරිහරණය කළ රු.10,350 ක් වටිනා බැටරිය ඉවත්කර රු.11,120 ක වියදමකින් වෙනත් බැටරියක් යොදා තිබුණි.

**5.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**5.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ආකාරයට මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 03 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2** අභ්‍යන්තර විගණනය

ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදුකරනු ලබන අතර පවතින සම්පත් අනුව අභ්‍යන්තර විගණනය සැලසුම් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණනයක් සිදුකර අභ්‍යන්තර විගණන විමසුම් ඉදිරිපත් කර නොතිබුණි.

**5.3** අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 12 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය අනුව අයවැය ලේඛනය සමඟ අයවැයගත ආදායම් ප්‍රකාශනය, ශේෂපත්‍රය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අයවැයගත ආදායම් හා වියදම් සහ තත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 17 සිට සියයට 74 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6.** පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයක් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) සැලසුම් සකස් කිරීම
(ඊ) කාර්යසාධනය
(උ) ප්‍රසම්පාදන කටයුතු
(ඌ) අත්තිකාරම්